


# ප්‍රේත වස්තු කථා 3

## අංක I

සංස්කරණය

පූජ්‍ය අකුරේගොඩ රතනසාර හිමි.



# අඩි 428 ක් ඉහළ නැඟුණු "නාඳුනන සෙනෙහස"

ඇවිද යාමට නොහැකි 81 වියැති මහලු මවක් ඓතිහාසික සිතුල්පව්ව රාජමහා විහාරයේ අඩි 428 ක් උසක පිහිටි චෛත්‍ය රාජයාණන් වෙත ඔසවාගෙන යන තරුණයෙකු ඡායාරූපයේ දැක්වේ. මාකඳුර, තලහගම පදිංචි කේ.ජී. සීලවති නම් ඇවිදිමේ අපහසුවෙන් පසුවන එම වියපත් මාතාව සිය දියණියක හා ගමේ පිරිසක් සමඟ කතරගම වන්දනාවේ ගොස් තිබේ. එහිදී සිතුල්පව්ව රාජමහ විහාරයද වැඳ පුදාගැනීමට ගිය ඇය ධාතු මන්දිරය දෙසට ගොස් චෛත්‍ය මළුව දෙස බලාගෙන '' අනේ මටත් චෛත්‍ය වැඳ පුදාගන්ට මළුවට යන්න ඇත්නම් '' යැයි පවසමින් වැලි මළුවේ රැඳී සිටියදි එහි පැමිණි අදාළ තරුණයා ඇය දැතින් ඔසවාගෙන අඩි 428 ක් උස චෛත්‍ය මළුව වෙත මෙසේ ගමන් කළේය.

''අද''
07.12.2015

# ප්‍රේත වස්තු කථා 3

# අංක I

## අංක : 22

*සංස්කරණය*

**පූජ්‍ය අකුරේගොඩ රතනසාර හිමි.**

**නමෝ තස්ස භගවතෝ අරහතෝ සම්මා සම්බුද්ධස්ස !!!**

**කායෙන වාචා චිත්තෙන - පමාදෙන මයා කතං**
**අච්ච යං ඛම මෙ භන්තෙ - භූරිපඤ්ඤ තථාගත**
**අච්ච යං ඛම මෙ ධම්ම - සන්දිට්ඨික අකාලික**
**අච්ච යං ඛම මෙ සංඝ - පුඤ්ඤ ක්ඛෙත්ත අනුත්තරං**

ප්‍රෙත ආත්ම තුනක් මාතෘකා කර මෙම දහම් ග්‍රන්ථය සංස්කරණය කරන ලද්දේ ක්‍රි:ව් 2011 ජනවාරි මාසයේ තිනියාවල පූජාලෙන ආරණ්‍ය සේනාසනයෙහිදීය.

නැවත එය ප්‍රතිසංස්කරණය කර වර්තමාන අනුවේදනීය පුවත්පත් වාර්ථාවක් පසුබිම් කර මුද්‍රණයට යොමු කරන්නේ ක්‍රි:වෂී 2016 ජනවාරි මාසයේ කැළණියේ ගෝණවල ගුණරත්න යෝගාශ්‍රමයේහි වැඩ සිටිමින්ය.

## කුමාර ප්‍රෙත වස්තුව

**නමො තස්ස භගවතො අරහතො සම්මා සම්බුද්ධස්ස !!!**

තවද මේ ප්‍රෙත වස්තු දේශනාවෙහි චූලවර්ගාන්තර්ගත පස්වෙනි කුමාර ප්‍රෙත වස්තුව වෙයි. ඒ ප්‍රෙත වස්තුහුගේ උත්පත්තිය කවරද යත්:-

එදා සැවැත් නුවර බොහෝ උපාසකවරු ධර්මානුචාරීව එනුවර විශාල මණ්ඩපයක් කරවා එම මණ්ඩපය විචිත්‍රවත් කොට බුද්ධ ප්‍රමුඛ මහා සංඝරත්නයට ආරාධනා කොට වැඩවමාගෙන සුවඳ මල් ආදියෙන් පූජා කර මහා දන්දෙති. එය නුරුස්නා මසුරු මලයෙන් වැඩුණ ලෝභ පුරුෂයෙක් එම සත්කාර නොඉවසමින් '' මේවා කුණු ගොඩට දැම්මා

නම් මීට වඩා හොඳයි. මේ මුඩු මහණුන්ට දීමෙන් ඇති ඵලය මොකක්ද?'' යි කීවේය. එහි සිටි උපාසකවරු ඒ අසා කලකිරුණු සිත් ඇතිව, යම් විධියකින් මෙසේ බුද්ධ ප්‍රමුඛ මහා සංඝරත්නය කෙරෙහි වරදක් කරණ ලද්දේද, එනිසා මේ මෝඩ පුරුෂයා බරපතල පාප කර්මයක් කරගත්තේය, යි කියා ඔහුගේ මවට කීවේය.

එකී පුවත ඇසූ මව ඔහුට තරවටුකොට වහා ගොස් සංඝ රත්නය සමා කරගෙන එව, යි කීවේය. උපාසකවරුන් කී බස් පිළිගත් උපාසිකාව ඔහුට පෙර ඇය විහාරයට ගොස් සමාකරවා ගෙන පසුදා පටන් දින හතක් කැඳ පූජා කර ගත්හ. ඉන්පසු ටික දිනකට පසු පුත්‍රයා මියගොස් කලිෂ්ට කර්මයෙන් ජීවත් වන්නාවූ ගණිකාවකගේ කුස උපන්නේය. ඇයට ඔහු උපන් සැණෙන් දාරකයෙක් යැයි දැන සොහොනකට දම්මෙව්වේය. එම දරුවා සොහොනෙහි තමාගේ පුණ්‍ය බලයෙන්ම ගන්නා ලද ආරක්‍ෂා ඇතිව කිසිවකු විසින් නිරුපද්‍රිතව මවු තුරුල්ලෙහි සේම සුවසේ නිදිගත්හ. දෙව් දේවතාවෝ ඔහුට ආරක්‍ෂාව සැළසූහ.

එකල්හි බුදුරජාණන් වහන්සේ සකල සත්වයා වෙත පතල මහා කරුණාවෙන් ලෝකය දෙස බලන සේක්, සොහොනෙහි සිටි දරුවා දැක ඉරුදාඋවෙන් පසු සොහොනට වැඩම කරණු දුටු ජනී ජනයෝ භාග්‍යවතුන් වහන්සේ වැඩමවා වදාලේ මෙතන මොනවා හෝ හේතුවක් ඇතිවයි, සිතා එතනට එක් රොක් වූහ. රැස්ව සිටි පිරිසට මෙ දරුවා ලාමක කෙනෙකු යැයි නොසැලකිය යුතුයි. සෙහොනෙහි දමන ලදුව අනාථව සිටින නමුදු ඒ පිරිස විසින් '' ස්වාමීනි, භාග්‍යවතුන් වහන්ස, මේ ළදරුවා පූර්ව ජාතියෙහි කුමන කර්‍මයක් කරණ ලදදැයි'' විචාරණ ලදුව.

බුද්ධ ප්‍රමුඛ මහා සංඝරත්නයට මහත් පූජාවක් කළේය. එම පූජාවේදී පෙර ආත්ම භාවයේදී මේ දරුවාගේ සිතට අගෞරවයක් ඇතිවී අසභ්‍ය පරුෂ වචනයන් කීවේය, යි වදාරා ඔහු විසින් පෙර කරන ලද කර්මය හා මතු කාලයෙහි පැමිණි යුතු සම්පත්ද දේශනා කොට

වදාරා රැස්වූ පිරිසගේ අදහසට අනුරූපවූ ධර්ම දේශනා කළ සේක. එම දේශනාව මේ දක්වාම බොහෝ දෙනාට ධර්මාවබෝධය පිණිස හේතු වූයේය. එම දරුවාද අසූ කෝටියක් සම්පත් ඇති එක් සිටාණෝ කෙනෙක් භාග්‍යවතුන් වහන්සේ ඉදිරියෙහිම '' මගේ පුතාය'' යි කියා භාර ගත්තේය. බුදුරජාණන් වහන්සේ මෙපමණකින් දරුවා රක්‍ෂා කරණ ලද්දේය,යි රැස්වූ ජනයාටද අනුග්‍රහ කරණ ලද්දේය,යි සිතා වදාරා නැවත විහාරයට වැඩිසේක.

එකී කුමාරයා මෑත කලෙක එකී සිටාණෝ මිය පරලොව ගිය කල්හී ඔහු විසින් භාර දෙන ලද ධනය පිළිපැද කුල පරම්පරාව පිහිටුවමින් එනුවරම මහත් ධන සම්පත් ඇති ගෘහපතියෙක්ව දානාදි පින්කම්හි යෙදුණේය. ඉන්පසු එක් දිනක් භික්‍ෂූන් වහන්සේලා ධම්සභාවෙහි දී මෙසේ සාකච්ඡ කරමින් සිටියහ. බුදුරජාණන් වහන්සේ සත්වයන් කෙරෙහි තිබෙන මහා කරුණාව නිසා ඒ ධාරකතුමා එවකට අසරණව සිටයදී මේ කාලයෙහි මහත් භෝග සම්පත් විඳිමින්ම අපමණ පින්කම්ද කරති, යි කියා කථාවක් ඉපදවූහ. එය අසා බුදුරජාණන් වහන්සේ, '' මහණෙනි, එම කුමරුට ලැබෙන සම්පත් මෙපමණම නොවේ, තවත් ආයු කෙළවර තව්තිසා දෙව්ලොව සක්‍ර දේවේන්ද්‍රයාට පුතෙක්ව උපදින්නේය. මහත් දිව්‍ය සම්පත් ලබන්නේය'' යයි වදාළ සේක. එය අසා භික්‍ෂූහුද, මහජනයාද මේ කාරණය දැක දීඝී දර්ශීවූ බුදුරජාණන් වහන්සේ උපන් සැණින් සෙහොනේ දමන ලද එකුමරුහට එහි වැඩමවා සංග්‍රහ කළ සේක, යි කියා බුදුරජාණන් වහන්සේගේ ඥාන විශේෂයට ස්තුති කොට එම ආත්ම භාවයෙහි ඔහුගේ ජීවිත ප්‍රවෘත්තිය කථා කළාහුය.

බුදුරජාණන් වහන්සේ යම් සේ සොහොනෙහි දමන ලදුව අසරණව සිටි ළමයා අරභයා මතු සිදුවන වැඩ ප්‍රකාශ කොට වදාළ සේක්ද, එහෙයින් අනුන් හා සාධාරණනවූ ආශයානුශය ඥානාදී

සර්වඥාණය අන්‍යයන්ට විෂය කොට ඇත්තේය. එම නුවණ අන්‍යයන්ට විෂය නොවේ. එහෙයින් කුමරු පිළිබඳ ශාස්තෘ දේශනාවෙන්ම නුවණේ පුදුම භාවය හැඟේ, ප්‍රබල කුශලධර්ම ඇත්තාවූද මේ ලෝකයෙහි ඇතැම් පුද්ගලයෝ ලබන ලද හේතු සම්පත් ඇති එබඳු පුණ්‍ය කර්මයාගේ බලයෙන් ජාත්‍යාදියෙන් නිහීනයෝ වෙත්, ඉතා ස්වල්ප කුසල් බල ඇත්තාවූද ඇතැම් සත්වයෝ ක්ෂත්‍ර සම්පත් ආදී හේතුවෙන් ඒ පින් මහත් ආලෝක ඇති බැවින් උත්තමයෝ වෙත්.

සොහොනෙහි දමන ලද මේ කුමරුන් දෙවියන් විසින් ඇඟිල්ලෙන් වඩුරුවන ලද කිරි බීමෙන් රාත්‍රියෙහි යැපුනේය. කරණ ලද පින් බලයෙන් මෙම කුමරුට පිශාචවූ හෝ යක්ෂවූ හෝ සර්පයන්ගෙන් හෝ කිසිම සත්වයෙන්ගෙන් වත් පීඩාවක් වූයේ නැත. මේ කුමාරයාගේ දෙපා සුනඛයෝ තමන්ගේ දිවෙන් පිරි මැද්දාහුය, කපුටෝ හෝ හිවල්ලු කිසිවෙක් පීඩා නොකරත්වායි සිතා ඒ කුමරු ආරක්ෂා කරමින් නිරෝගී බැව් දූන ගැනීම පිණිස දඟලත්, උකුසු, ගිජු ලිහිනි ආදී පක්ෂීහු ගැබ්මල පහ කරත්, කවුඩෝ කබ පහ කරත්, කිසි මුනුෂ්‍යයෙක් කුමරු ආරක්ෂා කළේ නැත. අමුනුෂ්‍යයෝ විසින්ම ආරක්ෂා කලාහුය. එම අවස්ථාවේ හෝ මතුත් නිරෝගි බැව් ගෙනදෙන බෙහෙතක් හෝ උපන් දරුවාගේ අනාගත සෞඛ්‍ය සඳහා අබ වලින් දුම් ඇල්වීමක් කෙරෙත්ද එයත් එම දරුවාට නොලැබුණත් **" ආරෝග්‍යා පරමා ලාභා"** ජීවිතාන්තය දක්වා නොඅඩුව පැවැත්වූයේ බුද්ධ ප්‍රමුඛ මහා සංඝ රත්නය කෙරෙහි මහත් ශ්‍රද්ධා භක්තියෙන් යුතුව දින හතක් ඖෂධ කැඳ පූජා කිරීමේ ආනිසංස බලයෙනි.

**අති දීර්ඝ කාලයක් අටමහ නිරයන්හි මහත්, බලවත් දුක් වේදනා විදවන මුඛයෙන් පිටවුන වචන වල විපාක වශයෙන් ලැබුණේ ගණිකාවකගේ කුසින් බිහිවී සොහොනක නවාතැන් ගැනීම පමණයි.**

**වර්ථමානයේ මවුවරු පුත්තු දෙදෙනාත් සමඟ බිත්තර තුනක් තම්බා කෑමේ ආදීනව නොදැනීමත් බුදු දහම නුගත්කමක් නිසා කොටකෙතන ඉතා පිළිකුල් ආකාරයට මව මරා සොහොනකටත් අන්ත අමුනුෂ්‍යයන් ගෙන්වත් පිහිටක් නැති (මළගිය) මිනිය ගඟේ ගසක් මුල තැබීමෙන් එම දරුවාට කවදානම් පිළිසරණක් ලැබේද ? නොලැබෙන්නේමය. මවටද එසේමය. කවදා නමුත් (කොටකෙතන මව මැරූ පුතා) අටමහ නිරයෙන් නිදහස්වී තිරිසන් අපායේ ඉපිද අනන්ත කාලයක් ලැබෙන ලැබෙන පැටවු සහ බිත්තර සර්පයන්ට සහ මාංශ භක්ෂික සත්වයන්ට ආහාර වන්නේය. කවදා නමුත් නැවතත් මිනිසත් ආත්ම භාවයක් ලත් තැනදී ස්ත්‍රීව ඉපදී කුසට පිළිසිඳ ගන්නාවූ දරුවන් ගබ්සා වලට ගොදුරු වන්නේය. වර්තමාන ලංකාවේ දිනකට ගබ්සාවන් දහසකට වඩා සිදුවන්නේ ගැහැණු ළමයි කුකරි පංතිවලට යොමු කිරීම් ආදියත් මෙයට මූලික වන්නේය.**

**සම්බුධ ශාසනයක් පවත්නා මෙම කාලයෙහි දුක් සසරින් මිදීම වෙනුවට කර ගන්නේ පියාණන් බලු කූඩුවට දැමීමත්, මෑණියන් පරණ කකුස්සියට දැමීමත්, වැඩිහිටි නිවාස, බස් නැවතුම් පොළවල් ආදී මෙකී, නොකී වෙනත් තැන්වල දැමීම සහ වස්තු ඉල්ලා මව මැරීම, පියා මැරීම, සහෝදරයන් උන් උන් මරා ගැනීම, මෙහිදී අහිංසක මව, පියා සිතීම වැරදිය. ඔවුන් දරුවන්ට ආදර්ශමත් නොවීම නිසා එම දුවා පුතා කියා නිම කළ නොහැකි කල් සතර අපා දුක්වලට ගොදුරු වීමයි.**

**නැවතත් මාතෘකාවට ඃ-**

රෑ යාමයෙහි ගෙනවිත් සොහොනෙහි දමන ලදුව ඉතාම අසරණවූ මස් වැදැල්ල පමණක් වූ බැවින් වෙඬරු පිඬක් බඳුවූ දුර්වල බැවින් කම්පාවූ මෙසේ මස් වැදැල්ලක් පමණක් වූ අන්ත අසරණ දරුවා ගැන සම්මා සම්බුදු රජාණන් වහන්සේ විසින් අනාවැකි වශයෙන් මතු

මේ කුමාරයා මෙම නගරයෙහි භව භෝග වශයෙන්ද, ශ්‍රේෂ්ඨ කුල ඇත්තෙක් වන්නේ යයි ඔහු අරභයා තතු ප්‍රකාශ කළ සේක. එවිට තථාගතයන් වහන්සේ වෙත එම සොහොනේ රැස්ව සිටි පිරිස ඔහු විසින් පෙර කරණ ලද කර්මය විචාරීම් වශයෙන් '' ස්වාමීනී, භාග්‍යවතුන් වහන්ස, මොහුගේ වුත සමාදානය කුමක්ද? ශ්‍රේෂ්ට චර්‍යාව මොකක්ද? මොනවා පුරුදු කරණ ලද කුමන වුතයක් නිසා කෙබඳු ශ්‍රේෂ්ට චර්‍යාවක්ගේ විපාකයකින් ගණිකාවකගේ කුස තුල ඉපිද සොහොනේ දමන ලද විපතට පැමිණ සිටි කුමරු උක්තප්‍රකාර එම සම්පත් හා දිව්‍ය සම්පත් නැවත ලබන්නේද?'' යි ඇසීය.

එවිට බුදුරජාණන් වහන්සේ විසින් මෙසේ වදාළ සේක ඃ- සැවත් නුවර උපාසක පිරිසක් එකතුව බුධ ප්‍රමුඛ භික්‍ෂු සංඝයා වහන්සේට උදාරවූ පූජාවක් කළේය. එම පූජාවෙහි ( එම භාවයෙහි) මේ දරුවාගේ සිතට නරක පාප සිතිවිල්ලක් ඇතිවී සත්පුරුෂ සභාවට නරක පරුෂ වචනයෙන් ආමන්ත්‍රණය කළේය. ඒ මේ තැනැත්තා පසුව ඔහුගේ මව විසින් එහි විපාක දන්වූ කල්හී එම ලාමක නරක විතර්කය නැති කොට සතුටු සිත උපදවාගෙන ජේතවනාරාමයෙහි වැඩ වාසය කරන්නාවූ සර්වඥයන් වහන්සේ ප්‍රමුඛ සංඝරත්නයට දින හතක් ඖෂධ කැඳ පූජාවක් කළේය. ඔහුගේ ඒ වුතය සහ ඒ බ්‍රහ්ම චර්යාාවෙහි ඔහු විසින් පුරුදු පුහුණු කරණ ලද එම වුතයාගේ හා එම බ්‍රහ්ම චර්යාාවගේත් මේ එහි ආනිසංස යයි එම හේතුවෙන් මෙබඳු විපතකට පැමිණ සිටි ඔහු එබඳු උක්ත ප්‍රකාර මානුෂික සම්පත් හා දිව්‍ය සම්පත්ද ලබන්නේය. එසේම මෙම කුමාරයණන් මිනිස් ලොව අවුරුදු සියයක් ආයුෂ විඳ බොහෝ සෙයින් සම්බුධ ශසනයට සේවය කර කම්වූ පරිද්දෙන් මිය ගොස් දෙදෙව් ලොව අධිපති ශක්‍ර දේවේනද්‍රයාණන් වහන්සේගේ පුතුව උපදින්නේ, යයි වදාළ සේක.

## අවවාදයයි

මොහු සම්මුඪ ශාසනයක් පවත්නා කාලයක එහි හිමිකරු තත්වයට අවස්ථාව තිබියදීත් එයට පිටුපා අන්‍යයන් කළ පින්කම් පවා නොඉවසා මහෝත්තමයන්ට පරුෂ වචන කීමේ හේතුවෙන් විපතට පත්වූ අන්දමත් පින්වත් මැනියන්ගේ අවවාදය පිළිගෙන නිසිමඟ ගමන් කිරීමෙන් මතු ආශ්චර්යයමත් සැපතට පත්වූ ආකාරයත් මෙම කථා වස්තුවෙන් අවබෝධ කරගෙන මේ කාලයෙහිද වැරදි අපරාධ කරන නොහික්මුණු දරුවන්ට දෙමාපිය, වැඩිහිටියන් විසින් අවවාදානුශාසනා කොට ඔවුන් යහ මාර්ගයේ ගමන් කරවීමටත්, එසේම දරුවන් යහපත් අවවාදානුශාසනා පිළිපැදීමෙන් උදාරතර සම්පත් ලබා ගැනීමටත් සිතට ගත යුතුයි.

### නිට්ඨිතං

## මිගලුද්දක ප්‍රේත වස්තුව

### නමො තස්ස භගවතො අරහතො සම්මා සම්බුද්ධස්ස !!!

ප්‍රඥා සාගරවූ අප භාග්‍යවත් අර්හත් සම්මා සම්බුදු රජාණන් වහන්සේ වේළුවනාරාමයෙහි වැඩවසන සමයෙහි මිගලුද්දක ප්‍රේතයකු අරභය මෙම කථා වස්තුව වදාල සේක.

රජගහ නුවර සමීපයෙහි වැදි පුරුෂයෙක් දිවා රාත්‍රි මුවන් දඩයම් කර ජීවිකාව කළේය. ඔහුට එක් මිතුරු උපාසකයෙක් සිටියේය. ඔහු නොයෙකුත් ආකාරයෙන් මොහු කරන මෙම ප්‍රාණඝාතය නැවැත්වීම පිණිස උත්සාහ ගත්හ. නමුත් ඔහුගේ උත්සාහය වැඩක්

වූයේ නැත. එක් දිනක් ඔහු වැදි පුත්‍රයා අමතා මෙසේ කීවේය. ''මාගේ හිතමිත්‍රය ඔබගේ යහපත පිණිස මේ කියන දෙයටවත් ගරු කරන්නැයි ඉල්ලමින් අඩු වශයෙන් රාත්‍රි කාලයේවත් මේ මුව දඩයම නවතන්න'' යි කී පසු මිතුරාට ගරු කිරීමක් වශයෙන් අකමැත්තෙන් නමුත් උපාසකතුමාගේ ඉල්ලීම අනුව රාත්‍රි කාලයේ කරන මුව දඩයම නවතා දැමූහ.

මෙසේ කලක් ගෙවී ගිය පසු වැදි තෙමේ මැරී ගොස් රජගහ නුවර සමීපයෙහි විමාන ප්‍රේතයෙක්ව ඉපදී දිවා කාලයෙහි මහා දුක් විඳිමින් රාත්‍රි කාලයෙහි සැනසිල්ලෙහි සිටියේය. එම ප්‍රේතයා දුටු නාරද ස්ථවීරයන් වහන්සේ ඃ- ''එම්බා ප්‍රේතය, තොප රාත්‍රී කාලයෙහි සැප විඳීමටත්, දිවා කාලයෙහි එම සැප වෙනුවට අධික දුක් විඳවීමටත් තොප පෙර භවයෙහි කුමන ආකාරයේ ක්‍රියාවන්ගෙන් සිටියේද?, යි'' මට කියව.

ඒ අසා ප්‍රේතයා මෙසේ පැවසීය. '' ස්වාමීනි, මම පූර්ව ජාතියෙහි ගිරිවුජ නම් රජගහ නුවර වැසියෙක් වූ සත්ව ඝාතනයෙන් ජීවිකාව පවත්වාගෙන ගියෙමි. මම සතුන්ට නොයෙකුත් ආකාරයේ වද හිංසා පමුණුවා මරා මස් විකුණා මාගේ ආහාරයත් පිණිස ගත්තෙමි. එකල මාගේ හිතමිත්‍ර උපාසක මහතෙකු මම ඒ කරපු වැරදි ජීවිකාවෙන් මුදවා ගන්නට උත්සාහ කළත් එතුමාගේ බලවත් ඉල්ලීමට ගරු කිරීමක් වශයෙන් රාත්‍රි කාලයේදී පමණක් මුව දඩයමෙන් වැළකුණෙමි. එම හේතුව නිසා වෙනත් මාගේ සැඟවුන කුසල් බලයක් නිසා රාත්‍රී කාලයෙහි දිව්‍ය සම්පත් විඳිමි. රාත්‍රිය නිමාවීමත් සමඟ ඒ සතුන්ට දුන්නු වධ හිංසාවන් වලදී මම ලබපු තෘප්තිය අද මට අපමණ බියක් වේදනාවක් බවට පත්ව විඳවමි.''

එසේම, '' ස්වාමීනි, රාත්‍රි කාලයේ මම දිව්‍ය සම්පත් විඳින්නේ එම සැඟවුණ කුසල බලය තිබෙන තාක් කල් පමණයි. එයින් පසු තිබුණු කුසල් බලයත් අහෝසි වී පාපය පමණක් ඉතිරිවූ පසු මේ විඳින දුක් වලට වඩා අති භායානක වේදනා දෙන නරකයන්ට වැටුණු පසු කවදා එයින් මිදීමක් වන්නේද? මාගේ මිතුරු උපාසකතුමා මට මේ වන විපතින් ගලවා එතුමා සමඟ සුගතිගාමී වීමේ මාර්ගයට යාමට තිබුණ අවස්ථාව නැවත කවදා ලැබෙත්ද? අහෝ මම කරගත් අපරාධයක මහත.''

මෙසේ ඒ ප්‍රේතයා කී දෙය අසා තෙරණුවෝ එපවත් බුදුරජාණන් වහන්සේට සැළ කළ සේක. බුදුරජාණන් වහන්සේ එම කාරණය අර්ථෝත්පත්ති කොට පැමිණි පිරිසට ධර්ම දේශනා කළ සේක.

**නිට්ඨිතං**

**නමෝ තස්ස භගවතෝ අරහතෝ සම්මා සම්බුද්ධස්ස !!!**

## ධාතු විවර්ණක ප්‍රේත වස්තුව

බුදුරජාණන් වහන්සේ පිරිනිවන් පා වදාළ කල්හි ධාතු බෙදීමද කල කල්හි අජාසත් රජතුමා ලත් ධාතු කොටස ගෙන නොකඩවා අවුරුදු හතක් මාස හතක් හා දින හතක් පුරා බුදුගුණ සිහි කරමින් මහත් පූජා පැවැත්වූහ. ඒ ධාතු පූජෝත්සවයෙහි අප්‍රමෙය්‍යවූ සත්වයෝ සිත් පහදවා ගෙන සුගතිගාමී වූහ. අසූහය දහසක් පමණ මනුෂ්‍යයේ දීර්ඝ කාලයක් පුරා පුරුදු පුහුණු කරණ ලද භාවයෙන් සහ මිත්‍ථ්‍යා දර්ශනයෙනුත් පෙරළුණු සිත් ඇතිව පැහැදිය යුතු තැන්හිද තමන්ගේ සිත් දූෂිත කරගෙන ප්‍රේත අපායෙහි උපන්නේය.

ඒ රජගහ නුවරට ධන සම්පත් ඇති එක් පුරුෂයකුගේ බිරිඳ, දියණිය, යෙහෙළිය ප්‍රසන්න සිත් ඇතිව ධාතු වන්දනාව කරන්නෙමුයි කියා සුවඳ මල් ආදිය රැගෙන ධාතූන් වැඩ සිටි ස්ථානය වෙත යාමට සූදානම් උනවාය. එවිට එම ස්ත්‍රියගේ පුරුෂයා '' ඇට කටුවලට පුද පූජාවන් කිරීමෙන් මොන ප්‍රයෝජනයක්ද?'' යි කියා ඔවුන්ට නින්දා අපහාස කොට ධාතු පූජාවේ නුගුණ කීහ. ඔවුන් එම කීම් පිළිගෙන සිත්තුළ තිබුණු සර්ධා භක්තිය ඇතිව පුද පූජාවන් කර ආ පසු නිවෙස් වලට පැමිණියාහ. කාලයාගේ ඇවෑමෙන් ඔවුන් මිය ගොස් දෙව්ලොව උපන්නාහුය. ඒ ගෘහපතියා ක්‍රෝධයෙන් යුක්තව ටික කලකින් මැරී එම පාප කර්ම දෙක හේතු කොට ගෙන ප්‍රෙත අපායෙහි උපන්නාහ. එවිට එක් දවසක් මහා කාශ්‍යප ස්ථවිරයන් වහන්සේ සත්වයන් කෙරෙහි මහත් කරුණාවෙන් යම්සේ මුනුෂ්‍යයෝ එකී ප්‍රෙතයන් හා පින් කරගත් දෙව් දේවතාවනුත් දක්නාවූද එබඳුවූ සෘධ්‍යභිසංස්කාරයක් කළ සේක. එසේ කොට චෛත්‍යංගණයෙහි සිටියාහු ධාතු වන්දනාවෙහි නුගුණ කී එම ප්‍රෙතයාගෙන් මෙසේ ඇසූ සේක.

''එම්බල ප්‍රෙතය, තෝ කුණු ගඳින් යුක්තව අහසෙහි සිටිමින් දසඅත තොපගේ කුණුගඳ හමන්නේය. තෙපගේ කටපුරා පණුවන් කති. මෙසේ වීමට තොප පෙර භවයෙහි කුමණ ආකාරයේ පාප කර්‍මයක් කර ගත්තේද?'' යි අසා වදාළ සේක.

එවිට ප්‍රෙතයා මෙසේ කියන්නේ ඃ- '' ස්වාමීනි, මම එදා රජගහ නුවර ගිරිවුජ නම් පෙදෙසෙහි මහා ධන සම්පත් හිමි ගෘහපතියෙක්ව සිටියෙමි. එක් දිනක් මාගේ බිරිඳ, දියණිය, අපේ යෙහෙළියෙක්ද මා දූන් සිටින අහස් සීමාවේ ඉහළින් සිටින්නේ එම තුන්දෙනාය. ඔවුන් තුන්දෙනා දිනක් ධාතු වන්දනාවට යාමට සිටිනු දූක මට තරහ ගොස් දිනපතා මේ යන ගමන නැවැත්වීම සඳහා නරක පරුෂ වචනයෙන් බැණ වදිමින් ධාතූන් වහන්සේලාටද කරපු අපහාස වල විපාකය තමයි

මම මේ විධියට විඳවන්නෙ. මෙවන් දුකක් වේදනාවක් අන් කිසිවෙකුටවත් නොවේවා, යි ප්‍රාර්ථනා කරමි'' යි කීහ.

ප්‍රෙතයා කී කාරණය අර්ථොත්පත්ති කොට පැමිණි පිරිසට ධර්‍ම දේශනා කළ සේක.

**පින් කරන්නාවුන් එයින් වැළැක්වීමෙහි සහ පූජා සත්කාරයන් පිලිබඳව වැරදී කීමෙහිත් ඇති බරපතල කටුක දුක් විපාකත් මේ ප්‍රෙත වස්තු කථාවෙන් අවබෝධ කරගෙන එවැනි පරුෂ වචන භාවිතයෙන්ද, බොරු, කේලම, හිස් බොල් කථා වචන කීමෙන් වැළකීම යහපත් ප්‍රිය මනාප පුරවැසියෙක් වීමට සුදුසුකම් ලබා ගන්නා අත්තමයෙකි.**

**නමෝ තසස භගවතෝ අරහතෝ සමමා සම්බුද්ධසස !!!**

**නන්දක ප්‍රෙත වස්තුව**

මෙම ප්‍රෙත වස්තු කථාවේ උත්පත්තිය කෙසේද යත්ඃ- සම්මා සම්බුදු රජාණන් වහන්සේ පිරිණිවන් පා අවුරුදු 200 ක් ගෙවී ගිය පසු සුරට්ඨ නම් දේශයෙහි පිංගල නම් රජෙක් විය. ඔහුගේ නන්දක නම් සෙනෙවිතුමා මිථ්‍යා දෘෂ්ඨිකවූ විරූපි රූපයක් ඇති '' දන් දීමෙහි විපාක නැත'' යි යනාදියෙන් මිථ්‍යාදෘෂ්ඨි ග්‍රහණයෙන් වෙලී විසීය.

එම සෙනෙවියාගේ දෘහිතෘවූ උත්තරා නම් උපාසිකාව සුදුසු කුලයකට සරණ පාවා දෙන ලද්දේය. නන්දක නම් සෙනෙවියා මැරී වින්දධ්‍යා නම් වනාන්තරයෙහි නුග ගසක විමාන ප්‍රෙතයෙක්ව උපන්හ. ඔහු වෙනුවෙන් ඔහුගේ දියණිය පිරිසිඳු පැන් කළයක් හා සුවඳ මල්

මාලාවක් එක්තරා රහතන් වහන්සේ නමකට පූජා කර මේ දක්ෂිණාව මාගේ පියාණන් වහන්සේට හිත සැප පිණිස පැමිණේවා, යි කියා පින් අනුමෝදනා කළේය.

එම දීම හේතු කොටගෙන එම ප්‍රෙතයා හට දිව්‍ය පැන් සහ වෙනත් දේ පහළ වූහ. ඒ දැක ඔහු මෙසේ සිතුවේය ඃ- යම් හෙයකින් දෙන දෙයෙහි විපාක නැතැයි කියමින් ජනයා මිථ්‍යාදෘෂ්ඨි ගන්වන ලද්දේද, එසේ කිරීමෙන් මම කරගත්තේ බරපතල පාපකර්මයකි. මේ වන විට පිංගල රජතුමා ධර්මශෝක රජතුමාට උපදෙස් දීමට ගොස් සිටින්නේය. දැන් එම කටයුත්ත නිම කර ආපසු එන්නේ මා සිටින නුගරුක අසලින් නිසා මම පිංගල රජතුමාත් ඒ හරහා ධර්මශෝක රජතුමාත් මිථ්‍යාදෘෂ්ඨි භාවයෙන් මුදවා ගත යුතු, යි ඒ රජතුමා යන මාර්ගය අසුරා මම සිටින ස්ථානය අසලින් මාර්ගයක් මවා එම මාර්ගය රජතුමා සහ පිරිවර පසුකරන කොටස නොපෙනෙන්නට සලස්වා මා සමීපයට ගෙන්වා ගෙන වරද නිවරද කර නැවත ජනයා රජතුමාගේ මාර්ගයෙන් සම්‍යක් දෘෂ්ඨි මාර්ගයට යොමු කරමි, යි සිතා සිටියේය.

මේ අතර රජතුමාගේ පිරිසෙන් පසුපසම යන පුද්ගලයා පසුකරන කොටස පසුවත්ම එම කොටස නොපෙනී යන්නේය. එය අවබෝධ කරගත් මනුෂ්‍යයෝ මහත් භියට පත්ව රජතුමාට එපවත් දන්වා සිටි අවස්ථාවේ රජතුමාද මහත් භියට පත්ව ඇතුපිටම සිටිමින් වටපිට විපරම් කිරීමේදී ප්‍රෙතයා වසන නුග රුක දැක ඒ වෙත ගියේය. එවිට ප්‍රෙතයා සර්වාභරණයෙන් සැරසී රජතුමා වෙත පැමිණ රජතුමා ඇතුළු පිරිසගේ සැක භිය සංසිඳුවා රජතුමා මෙසේ ඇසීය. '' ඔබ කවුද ? යි'' ඇසීය. එවිට එම ප්‍රෙතයා පෙර ආත්ම භාවයේ මුල පටන් සියළු විස්තර සමඟ එම ආත්ම භාවයේ ඔහුගේ දියණිය ඔහු වෙනුවෙන් සංඝයා වහන්සේ නමකට ශක්ති ප්‍රමාණයෙන් පිරිනැමූ දන් පැන් බලයෙන් තමන් සුඛිත මුදිත භාවයට පැමිණියා පමණක් නොව

ඔබලාගෙත් සා පිපාසා නිවා දැමීමට හැකිවීම නිසා දෙන දානයෙහි විපාක දැනගත් නිසා මම ගිය වැරදි මාර්ගය ඔබතුමා ඇතුළු පිරිසට අවබෝධ කරදීම සඳහැයි මාගේ සීමාවට උපක්‍රමයෙන් ගෙන්වා ගත්තේ, යයි කීවේය. එසේ ගෙන්වා ගත්තේ අන් කිසිවක් නිසා නොව ලොව පවත්නා සත්‍යය මිත්‍යාදෘෂ්ඨියෙන් වසා සත්වයා සදා කල්හි සසර දුකින් මිදීමට අවස්ථාව වළක්වාලීම සඳහා අපමණ දුක් දෙන සතර අපායන්හිම රඳවා තබන්නේය. මමද එම මිථ්‍යා දෘෂ්ඨියෙන් මුදවා සත්‍ය අවබෝධ කරදී අටමහ නිරයන්ට වැටීමෙන් මිදුනේ සම්බුද්ධ ශාසනයක් තිබීමත්, එය අවබෝධ කරගත් මාගේ පෙර භවයෙහි දියණිය මා වෙනුවෙන් පිදූ දන් පැන් නිසාය.

යම් පුරුෂයෙක් තවත් පුරුෂයකු මරන්නේද, එහිදී පරමාර්ථ වශයෙන් කිසිවෙක් කිසි සත්වයකු නොමරයි, පෘථිවි ආදී සප්ත ධාතුකාය සිඳුරු බැවින් මරන්නාක් මෙන් වෙයි. පෘථිවි ආදී සප්තධාතු ශරීරයාගේ සිඳුරු ආයුධය ඇතුල් වෙයි. එහෙයින් සත්වයෝ කඩු, කිණිසි ආදියෙන් ගසා මරණ ලද්දක්හු මෙන් වෙත්, ජීවයමෙන් සෙසු ශරීරයෝද නිත්‍ය ස්වභාවය හෙයින් නොසිදෙත්, සත්වයන්ගේ මේ ජීවය නිත්‍ය ස්වභාවය හෙයින් ආයුධයකින් ගසා මැරිය නොහැක. නොබිඳිය හැක. ඒ ජීවය වනාහී ඇතැම් කලෙක විසිරෙයි. ඇතැම් කලෙක ගුළියක් සේ පිරිමඬුලු වෙයි. හුදෙකලා බවට පැමිණියේ නම් යොදුන් පන්සියයක් උසවේ. මෙසේ නිත්‍ය වූ විකාර රහිතවූ ජීවය ආයුධාදියෙන් කපන්නට සමර්ථයෙක් කොයින්ද ? එම ජීවය කැපීම ආදී කිසිවකින් වෙනස් කල නොහැක.

යමෙක් උස් ස්ථානයක සිට නූල් පන්දුවක් දිග හැරීම පිනිස දැමූ කල්හි නැවත පන්දුව වශයෙන් නොවේලීම එම පන්දුව අවසන් වනතුරු පහතට වැටෙත්ද, එසේ නූල අවසනය වූ පසු නැවති සිටිත්ද, ඒ ජීවය මහා කල්ප අසූහාර ලක්ෂයක් පුරා ආත්ම භාවය නමැති ගුළිය

වෙලෙන්නේ නැතිව පවතී. යම් පුරුෂයෙක් තමන් පදිංචි ගමෙන් නික්ම යම්කිසි කාර්‍ය්‍යයක් සඳහා වෙනත් ගමකට යයිද එසේම ඒ ජීවයද මේ ශරීරයෙන් නික්ම වෙනත් ශරීරයකට නියත වශයෙන් පැමිණෙයි. යමෙක් තමා සිටි නිවසින් නික්ම වෙනත් නිවසකට පැමිණෙත්ද, එසේම එම ජීවය මෙම ශරීරයෙන් ඉවත්ව වෙනත් ශරීරයකට ඇතුලත් වේ.

මේ ලෝකයෙහි මෝඩයෝ වෙත්ද, පණ්ඩිතයොත් වෙත්ද, ඒ සියල්ලෝම මහා කල්ප අසූහාර ලක්‍ෂයක් එහෙමෙහි ඉපදීම් වශයෙන් සසර ගෙවා දුක් කෙළවර කරන්නේය. පණ්ඩිතයෝද අතරතුර සසර සිඳලන්නට නුපුළුවන් වෙත් බාලයෝද ඒ මහා කල්ප අසූහාර ලක්‍ෂයට වැඩියෙන් නොපවතින්නේය, යයි කියා ඔහුගේ ලබ්ධිය වේ. එහි මහා කල්පය නම් ඃ- අනවතප්තාදි එක් මහා විලකින් අවුරුදු සියයකට වරක් එක් දිය බිඳක් ඉවත් කරත්ද, ඒ ක්‍රමයෙන් හත් වාරයක් ඒ විලෙහි ජලය හිස්වූ කල්හි එක් මහා කල්පයක් යයි කියා මෙබඳු මහා කල්ප අසූහාර ලක්‍ෂයක් සසර ගමන නම් වේ, යයි කියත්,

සත්වයන්ගේ සැප දුක් දෙක ද්‍රොණයෙන් හෝ පැසකින් මණින ලද්දක් මෙන් යටකියන ලද කාල පරිච්ඡේදයෙන්ම පමණ කරන ලද බැවින් නියතින් සමව පවත්නාහුය. ඒ මේ සියල්ල බුධ ශාසන භූමියක සිටින කෙනෙකු හැර අන් කවරෙක් දනීද ? අන් දාර්ශණිකයෝ මෝහයෙන් මූලාවට පත්ව කරකැවෙයි.

" මහ රජතුමනි, මම පෙර මෙසේ කියන ලද නාස්තික මිථ්‍යාදෘෂ්ඨි ඇත්තෙක් වූයෙමි. ඉහත කියන ලද දෘෂ්ඨියට හේතු කාරණා වූ අතිශය මූලාවූයෙමි. සහජාත මෝහයෙන් වැසුනු කුසල් බිජු ඇත්තෙක් වීමි. මෙසේ මිථ්‍යා දෘෂ්ඨිකයෙක්ද, දුශ්ශීලයෙක්ද, තද මසුරු සිත් ඇත්තෙක්ද, මහණ බමුණන්ට නින්දා අපහාස කරන්නෙක්ද වූ යෙමි, යි කීහ.

මෙසේ පෙර භාවයෙහි තමන්ට උපන් යම් ලාමක මිථ්‍යා දෘෂ්ඨියක් වීද ඒ මිත්‍යා ලබ්ධියාගේ වශයෙන් කරන ලද පාපකර්ම දක්වා නැවත තමා විසින් මතුකාලයෙහි විඳිය යුතු එම පාප කර්මයාගේ විපාක දක්වමින් ප්‍රෙතයා කියන්නේ, '' මහ රජතුමනි, තව නොබෝ කලකින් මැරී නිරන්තරයෙන් කටුකවූ නිරයට වැටෙන්නේය'' යයි කීය.

සිතුවත් භිය උපදවන නිරන්තරයෙන් ඇසි පියන ගසන මොහොතකුඳු අවසරයක් නැතිව හාත්පසින් ගිනි ජාලාවෙන් පිළිස්සෙමින් පාප කර්මයේ බලයෙන් නොමැරී මහා දුක් වේදනා, විලාප භියකරු ශබ්ද, ගවඝාතකයින් සේ යමපල්ලන්ගෙන් ශරීර කැපුම්, කෙටුම් ආදීයෙන් සා, පිපාසා දියක්වත් නොදුනී අවුරුදු ලක්‍ෂයක් ගෙවී ගිය පසු, ' තොප මෙහි ඉපිද දූනට අවුරුදු ලක්‍ෂයක් අවසන්' යයි කියන ශබ්ද මාත්‍රයක් පමණක් ඇසෙයි. තවද, මහ රජතුමනි, මෙයාකාරයට නිරයේ විඳවන නිරිසතුන්ට අවුරුදු ලක්‍ෂයෙන් ලක්‍ෂයට එම කාලය දන්වමින් එහි පරමායුෂ අවුරුදු කෝටි සියයකි''

එම සියයක් කෝටියද මිනිස් ලොව අවුරුදු වශයෙන් නොව අටමහ නිරයන්ට අයත් අවුරුදු වශයෙනි. (උපමාවක් වශයෙන් සදිව්‍ය ලෝකයන්හි ආයුෂ මිනිස් ලොව අවුරුදු 50, චාතුර්මහා රාජිකයට එක් දිනකි. මිනිස් ලොව අවුරුදු සියය තව්තිසා දෙව්ලොවට එක් දිනකි. එසේම මිනිස් ලොව අවුරුදු 200 යාම දෙව් ලොවට එක් දිනකි. අවුරුදු 400 තුසිත දෙව් ලොවට එක් දිනකි. එසේම නිම්මානරති දෙව් ලොවට මිනිස් ලොව අවුරුදු 800 එක් දිනකි. එසේම අවසාන දෙව් ලෝකය වූ පරනිම්මිත වසවර්ති දෙව් ලොවට මිනිස් ලොව අවුරුදු 1600 එක් දිනකි.) එයාකාරයට සදිව්‍ය ලොව ආයුෂ වර්ධනය වන්නා සේ අටමහ නිරයේ වර්ධනයද වේ.

දෙව් ලොව ආයුෂයටත් වඩා අටමහ නිරයේ ගණන දිගය. මෙයාකාරයට නිරයගාමී වන සත්වයාට ආයුෂ බොහෝ දීර්ඝය. යම් මනුෂ්‍යයෙක් කිසියම් පාපකර්මයක් හේතු කොට ගෙන නරකයෙහි නිරය වර්ෂ වශයෙන් අවුරුදු කෝටි ගණනින් පැසැන්නේ මිථ්‍යා දෘෂ්ඨිකයන්, දුශ්ශීලයන්, ආර්යෝපවාද අකුසල් කර ගත්තොය.

'' තවද මහ රජතුමනි, මම මේ කෙටි කාලය ගෙවන්නේ දුකෙන් සහ මතු මට මෙතකැයි කියා නිමකල නොහැකි අතී දීර්ඝ කාලයත් අති භායානක නිමක් නැති වේදනාවන්ට හියෙනි. ඒ මන්ද යත් ඃ- පඤ්චානන්තරිපාප කර්මයටත් වඩා දරුණු පාප කර්මයක් වූ නියත මිථ්‍යා දෘෂ්ඨිය ගැනීමත්, අන් අයත් එම මගට ගැනීමත්, පින් කරන අය එයින් වැළැක්වීමටත් ගත් උත්සාහයත්, ත්‍රිවිධ රත්නයට ගැරහීමත් නිසා මට කිසිම සැනසීමක් නම් නැත.'' මෙසේ තමා විසින් මතු කාලයෙහි විඳිය යුතුවූ අකුසල් විපාක දක්වා නැවත රජතුමා මෙසේ විමසීය.'' නුඹගේ කුමණ බ්‍රහ්මචර්යයා හේතුවකින් ඔබට මේ ආනුභාවය ඇති වූයේද ?'' යි කියා රජතුමා විසින් ඇසූ කාරණය කියා ඔහු සරණයෙහි සහ ශීලයෙන් පිහිටවනු කැමතිව කියන්නේ ඃ-

'' මහ රජතුමනි, මාගේ පෙර ආත්ම භාවයෙහි උත්තරා නම් දියණිය පින්දහම් කරයි. නිත්‍ය පඤ්ච ශීලයෙහි සහ උපොසළු ශීලයෙහිත් පිහිටියේය. භික්මුණිය, දන් දෙන්නීය, පර කුලයෙහි යෙහෙළියක් වූවත් ශික්ෂාව ආරක්ෂා කරන්නීය. ~~සම්මා සම්බුදු රජාණන්~~ වහන්සේ නමක් ගමට පිණ්ඩපාතය සඳහා වැඩිය අවස්ථාවේ ඇගේ නිවසටද වැඩි සේක. උත්තරාව එම භික්ෂූන් වහන්සේ මිදුලේ වැඩ සිටිනු දැක මහත් සතුටට පත්ව ආදර ගෞරවයෙන් යුතුව පිරුණු පැන් භාජනයක් සහ පුරවණ ලද කැවිලි භාජනයක්ද පූජා කොට '' ස්වාමීනි, මාගේ මිය පරලොව ගිය පියාණන් වහන්සේට මේ දක්ෂිණාව ලැබේවායි'' යි කියා පින් අනුමෝදනා කළේය.''

'' එම පින් අනුමෝදනාවත් සමඟම මට දාන විපාක පහළ විය. දිව්‍ය රාජයකු සේ මම පින් බලයෙන් බැබලෙමි'' දේවයන් වහන්ස, මා කියන්නක් ඇසුව, බුදුරජාණන් වහන්සේ දෙවියන් සහිත ලෝකයා හට අග්‍රයයි කියනු ලැබෙත්, පුත්‍රදාරාවන් සහිතවූ තෙපි ඒ භාග්‍යවතුන් වහන්සේ සරණ යව, අංග අටකින් යුත් ආර්‍ය්‍ය මාර්ගයෙන් ප්‍රාඥයෝ නිවණ ලබත් අෂ්ඨාංගික මාර්ගය සහ නිවණද වූ ඒ ධර්මය පිහිටාධාර කර ගනුව, ප්‍රාණ ඝාතයෙන් වළකිනු, හොර, බොරු, කපටි, වංචා වලින් වළකිනු, මත් ද්‍රව්‍ය භාවිතයෙන් වළකිනු, ස්වකීය බිරිඳගෙන් සතුටු වනු, පරදාර සේවනයෙන් වළකිණු මැනව.

මෙසේ ප්‍රෙතයා විසින් සරණ හා ශිලයත් සමාදන් කරවනු ලද්දාවූ රජතුමා සතුටු සිත් ඇතිව කියන්නේ, එම්බා යක්‍ෂය, නුඹ මාගේ යහපතට, නියම මාර්ගයට පිවිසීමට, මෙතෙක් මා ගිය වැරදි මාර්ගය හේතු කොටගෙන මහාදුක් නිරන්තරයෙන් දෙන අපායෙන් මිදෙව්වේය. '' පින්වත් දෙවිය, ඔබගේ අවවාද අනුශාසනා මම ඔබ කිව් ආකාරයෙන් අද මෙතැන් පටන් එසේම පිළිපදිමි. ඔබ මාගේ ගුරුවරයාය. මම මෙතැන් මෙවෙලේ පටන් තිසරණ සහිත පඤ්චශීලය දිවිහිමියෙන් රකිමි. බුධ, ධම්ම. සංඝ රත්නය හැර වෙනත් ලබ්ධියක් නොගනිමි. ඔබගේ අවවාද අනුශසනා අනුව මාගේ රට වැසියාද යහමඟට ගනිමි'' යි කියා තවද මෙසේ කීහ.

පින්වත් දෙවිය, (එසේ කීමට හේතුව පෙර කරගත් අකුශල විපාක වශයෙන් නිරයගාමී වීමට වුවත් තමාගේ එකම දියණිය අනුමෝදනා කරණ ලද පුණ්‍යාණු මෝදනාවේ බලයෙන් සහ ලැබීමෙන් මිථ්‍ය දෘෂ්ඨි ග්‍රහණයෙන් මිදී රජකෙනෙකුට ධර්ම දානය දීමෙන් එමඟින් එතුමාත් ධර්මශෝක රජතුමාත් සියළු රට වැසියාත්, අද දක්වා පැවත එන පරම්පරා 30 ක් පමණ වූ අප දක්වාත් එසේම මේ සම්බුධ ශාසනය තව ඉදිරියට අවුරුදු 2400 ක් දුරට උපදින පින්වත්, වාසනාවත් සත්ව

සංහිතියට දුන්නාවූ එම ධර්ම දානයේ ආනිසංස බලයෙන් ඉතා කෙටි කාලයකින් නිරා දුකින් මිදී සම්‍යක් මාර්ගයට පිවිසෙන කුසලක් කරගත් නිසාය.) දුර නොබලන ලඟ පමණක් බලන දුවන්නන් වාලේ දුවන සර්ව ආගම් පිළිගන්න ඒවායේ පිළිසරණ සොයන බෞද්ධයෙනි, ධන බලයට, නිළ බලයට වහල්වන බෞද්ධයෙනි, භාවනාව නොව මෙකී දේ කමටහනට ගෙන මළගිය ඇත්තන්ට පින් අනුමෝදනා කරන විධියවත් හරිහැටි ඉගෙන මින් ඉදිරියට තිරොකුඩ්ඩ ප්‍රෙත වස්තුවේ හත් දවසක් බුද්ධ ප්‍රමුඛ මහා සංඝ රත්නයට දන් දෙන්න සිදුවූයේ ඇයි දැයි සිතන භාවනාවට සිත යොමු කරන්න.

## "එතං මංගල මුත්තමං"
## ඉතිරි කොටස

පින්වත් යක්‍ෂය, මහා සුළඟ හමන විට බොල් ඉවත් කරන්නාක් මෙන් මගේ ඒ ලාමක දෘෂ්ඨි නමැති බොල් ඔබගේ ධර්ම දේශනා නමැති සුළඟේ හරිමි. දරුණ සැඩපහර ඇති ගංගාවෙහි, තෘණ, කාෂ්ට, කුණු කලස හැර දමමි. එයට හේතුව නම් ඃ- යම් හෙයකින් මම සම්මා සම්බුදු රජාණන් වහන්සේගේ ශාසනයෙහි සිත පැහැදීමෙන්ද එනිසා ඒ මිථ්‍යාදෘෂ්ඨී වස විස වමාරා දමමි. සුරට්ඨාධි පතිවූ රජතුමා මෙසේ කියා ලාමක දෘෂ්ඨියෙන් වැළකී තිසරණ සහිත පඤ්ච ශීලය සමාදන්ව නැගෙනහිර දෙසට අභිමුඛව ගමනට සැරසී තම රථයට නැංගේය. රජතුමා නැගුණු රථය යක්‍ෂානුභාවයෙන් එදිනම සිය නුවරට පැමිණ, රාජ මන්දිරයට ඇතුල් විය. රජතුමා ඉන්පසු මෙම පුවත භික්ෂූන් වහන්සේලාට දැන්වූහ. එවිට භික්ෂූන් වහන්සේලා එම පුවත ස්ථවිරයන් වහන්සේලාට සැළකලාහුය. එවිට තෙරුන් වහන්සේලා තෘතීය සංගීතියෙහිලා සංග්‍රහවට නැගූ සේක.

**මෙසේ මේ ප්‍රෙත වස්තු දේශනාවෙහි මහා වර්ගයෙහි තුන්වන " නන්දක ප්‍රෙත වස්තු වර්ණනාව"**
**නිමි**

# ණය බරින් ගිනි තබාගත් මහතා

## (03.08.2015 ඉරිදා දේශය පුවත්පත)

**වත්මන් සමාජයේ මුදල් සංසරණය වන ආකාරයට අනුව සිදුවන ආර්ථික දෝලනය තුළ මෙම කරුණ දැවැන්ත බලපෑමක් ඇති කරමින් එවැනි දුක්බර සිද්ධීන් වලට ප්‍රජාව අවතීර්ණ කරවීමේ ප්‍රවණතාවයක් ඇති කරවන සමාජ රටාවක් දැන් උදාවී ඇත.**

එවැනි පදනමක් මත සිදුවූ ඛේදජනක සිද්ධියක් ඉකුත් (02) දින අම්පාර නගරයේදී ජනතාවට දැක ගත හැකිවිය. එක්තරා මූල්‍ය ආයතනයකින් (කල් බදු සේවා ක්‍රමය) ලීසින් පහසුකම් යටතේ වාහන මිලදීගත් ව්‍යාපාරිකයෙකු තම ගැටලුව වෙනුවෙන් විසඳුමක් නොලැබූ බැවින් ගනු ලැබූ එම බිහිසුණු තීරණය සැබවින්ම දුක්බර එකකි.

**පසුගිය 02 වැනි දින පෙරවරු 11.15 පමණ එම මූල්‍ය ආයතනයට ඇතුළු වූ ව්‍යාපාරිකයා සිරුරට පෙට්‍රල් හලාගෙන පිළිස්සුම් තුවාල ලැබූ අතර මූල්‍ය ආයතනයට අයත් කාර්යාල දේපළ වලටද බර හානියක් සිදුවී තිබුණි. එම ආයතනයෙන් ෆිනෑන්ස් පදනම මත ලබාගෙ තිබුණ ටිපර් රථයට වාරික ගෙවීම ප්‍රමාද වූයෙන් මූල්‍ය ආයතනය නැවත එය තම භාරයට ගැනීමෙන් සිත් වේදනාවට පත් ව්‍යාපාරිකයා මෙසේ ගිනි තබා ගෙන ඇති බව පොලිස් පරීක්ෂණ වලින් අනාවරණය වී ඇත. එහෙත් මෙම සංසිද්ධියට පාදක වූ මෙතෙක් ජනමාධ්‍ය හරහා කතාබහට ලක් නොවූ බොහෝ කරුණු ජනතාවගේ කතාබහට දැන් ලක්වෙමින් තිබේ.**

ඇතැම් මූල්‍ය ආයතන බළල් අතක් ලෙස සීසර්වරුන් යොදා ගැනීමෙන් සිදුවන අකටයුතුකම් හා සිත්ගන්නාසුලු උප්පරවැට්ටි වලට රැවටෙන සේවා ලාභීන් පත්වන ඉරණම ගැනද ජනතාව කථා කරති. වාහන අහිමිවූ තවත් බොහෝ දෙනා ලීසිං නම් අරහංයැයි පවසන්නේ

එයින් වන සේවය ලබා ගන්නට නොදත් මූල්‍ය කළමනාකරණය ද නොතකමිනි. හිඟුරාණ පැරණිගම අංක 21 ලිපිනයේ ජී.ඇම්. අජිත් සරත් ගුණරත්න නැමති ව්‍යාපාරිකයා තම සිරුරට ගිනි තබා ගැනීමේ සිද්ධිය ගැඹුරින් සළකා බැලීම වඩාත් කාලෝචිත වන්නේ එබැවිනි. ලීසිං පහසුකම් යටතේ අත්දැකීම් ඇති අයකු වූ ඔහු එම පදනම මත වාහන හයක හිමිකරුවකු ලෙස කටයුතු කළ අයෙක් විය. ඒ අනුව එම සිද්ධිය ගැන කතා කරන බොහෝ දෙනාගේ අවධානයට ගෝචර නොවූ ඒ අගතිය කුමක්ද? ඔහුගේ මරණය සම්බන්ධයෙන් අධිකරණ නියෝගය මත පැවැත්වූ මරණ පරීක්ෂණයේදී අනාවරණය වූ සාක්ෂි වලින් ඒ ගැන පැහැදිල වෙයි. මෙම මරණකරුගේ පුත් ජී. ඇම්. ප්‍රභාත් ගුණරත්න මෙසේ කීය.

**තාත්තට වාහන හයක් තිබුණා. ඊට අමතරව කල්මුණ පාරේ බත් කඩයක් පවත්වාගෙන ගියා. තාත්තා වාහන ගත්තේ ෆිනෑන්ස් කරලා. පසු කාලයේදී එම වාහන වල වාරික ගෙවාගන්න බැරිවුණා. ඒ නිසා වාහන දෙකක් ෆිනෑන්ස් ආයතනවලට බාර දුන්නා. තාත්තාට අයත් වාහන වලින් ඉතිරිවී තිබුනේ අංක එල්. අයි 13161 ටිපර් රථය සහ මගී බස් රථය පමණයි. මෙම රථයට මාස කිපයක් ණය වාරික ගෙවා ගන්න බැරිව තිබුණා. ඒ නිසා මූල්‍ය ආයතනයෙන් නිතර නිතර ඒ ගැන දුරකථන ඇමතුම් ලබාදෙමින් දැනුවත් කළා.** මේ අතර එම වාහනයට අලුත් ටයර් දැම්මා. ඒ සඳහා මුදල් පොලියට සොයා ගත්තා. ඊට අමතරව ටයර් කඩවලින්ද ණයට ටයර් ලබා ගත්තා. ඉන් පසුව වාහනය වැඩ කළා. මේ අතර තමයි සීසර්ලා ඇවිත් වාහනය බලෙන් අරන් ගියේ.

තාත්තා මේ ගැන මාත් එක්ක කතා කළා. ඔහු කවදාවත් ෆිනෑන්ස් කරපු වාහන වල හිඟ වාරික නොගෙවා සිටියේ නැහැ. ගෙවන්න බැරිනම් ඒවා ෆිනෑන්ස් අයතනයට භාර දුන්නා. '' ටයර් දැම්මට පස්සේ තමයි මේ ටිපර් එක අරන් ගියේ. කලින් ඒ ගැන කීවානම් වාහනය කලින්ම බාර දෙනවා. මෙම කාරණය ගැන මම ෆිනෑන්ස්

කොම්පැනියට කියලාත් තිබුණා. ඒ වෙලාවේ ඒ අය කීවේ ටයර් දාලා දුවන්න අල්ලන්නේ නැහැ කියලා'' යැයි තාත්තා මට කියා තිබුණා.

ඔහු මෙසේද කීය.

'' මේ සිද්ධිය නිසා තාත්තා දැඩි ලෙස සිත් වේදනාවට පත්ව සිටියා. කෑම බීම ගත්තේ නැහැ. බලාගත් අත බලාගෙන සිටියා. මේ අතර වාහනය බේරා ගන්න මුදල් හෙව්වා. ඒත් මුදල් ලැබුණේ නැහැ. අපිට තිබුණු ප්‍රධාන ආදායම් මාර්ගය මෙම වාහනය විතරයි. ඒ නිසා මෙම වාහනය වෙනත් කෙනෙකුට විකුණන් සූදානමකුත් තිබුණා. ටයර් වල සල්ලි දීලා ෆිනෑන්ස් ගෙවලා වාහනය අරන් යන්න කියලා තිබුණා. ඒත් එය හරිගියේ නැහැ. ''

සිද්ධිය වූ 02 උදේ මම පාසල් ළමුන් ප්‍රවාහන කළා. දවල් දොළහට විතර ටිපර් එකේ වැඩ කරන සම්පත් ඇවිත් කීවා අම්පාර නගරයේ ෆිනෑන්ස් සමාගම් කාර්යාලය ඇතුළේදි තාත්තා ගිනි තියාගත්තා කියලා. මම තාත්තා බලන්න අම්පාර රෝහලට ආවා. බාහිර රෝගී අංශයේ ප්‍රාථමික ප්‍රතිකාර ඒකකයේදී තාත්තා ඉන්නවා දැක්කා. ඔහු කතා කළේ නැහැ. මුලු ඇඟම පිළිස්සී කළු පාටවී තිබුණා. ඔහුගේ ජීවිතය බේරා ගන්න අපහසු බව මා වෛද්‍යවරයකුගෙන් කළ විමසීමේදී දැනගත හැකිවුණා.

ගම් ප්‍රදේශ කීපයක ජනතාව හඬවා ඉකුත් 14 දින අවසන් ගමන් ගිය මෙම ව්‍යාපාරිකයා කාගේත් සිත් දිනාගත් අයෙකි. එහෙත් ඔහුගේ සිත් වේදනාව නැති කිරීමට කිසිවෙක් නොසිටියේය. මුද්‍රා තබන ලද ඔහුගේ සිරුර සහිත දෙන වෙත පැමිණි බොහෝ පිරිස් හදවතින් හඬා වැළපෙමින් ඔහුට අවසන් ගෞරව දක්වූහ. මෙම සිද්ධියෙන් ඔහුගේ බිරිඳ බී. ඇම්. ශ්‍රියාණි ස්වර්ණලතා (42) මහත්මිය ඇතුළු දරුවන් දෙදෙනා දැඩි කම්පාවට පත්ව සිටිති.

මෙම මරණය සම්බන්ධයෙන් මහේස්ත්‍රාත් නියෝගය පරිදි අම්පාර මහා රෝහලේ අධිකරණ වෛද්‍ය නිලධාරී සී.ඒ. රණසිංහ මහතා පවත්වන ලද පශ්චාත් මරණ පරීක්ෂණයේදී මෙය සිරුරට ගිනි තබා ගැනීමෙන් ශරීරයේ අභ්‍යන්තර ඉන්ද්‍රියන්ට සිදුවූ හානියෙන් වූ මරණයක් බවට තීරණය කළ අතර එම වෛද්‍ය වාර්තාව සහ ලබාගත් සාක්ෂි සැළකිල්ලට ගත් නාගරික හදිසි මරණ පරීක්ෂක කේ. කරුණාරත්න මහතාද මෙය ඉහත හේතූන් මත සිදුවූ හදිසි මරණයක් බවට තීරණය කළේය. මේ පිළිබඳව මහේස්ත්‍රාත් පරීක්ෂණය මාර්තු මස 24 දින දක්වා කල් තැබිණි.

මේ සිද්ධිය ගැන නම හෙළි කිරීමට අකමැතිවූ ව්‍යාපාරිකයෙකු අදහස් දක්වමින් මෙසේ කීය. '' වාහනයක් ෆිනෑන්ස් පදනම මත ගත්තාම එහි වාරික ගෙවා ගන්න බැරිව උස්සන කොට පුදුම දුකක් වගේම මානසික තත්වයක් ඇති වන්නේ. මමත් මෙවැනි අවස්ථාවකට මුහුණ පෑව කොනෙක්''

**ෆිනෑන්ස් වාහනයක් උස්සපුවාට පස්සේ නැවත ඒක ගත්තත් වැඩක් නහැ. එහි තියෙන අමතර කොටස් ඔක්කොම සීසර්ලා ගලවා ගෙන තමයි ෆිනෑන්ස් ආයතනයට භාර දෙන්නේ. සමහර අයගේ වාහන වල අමතර රෝද හයිඩ්‍රොලික් ජැක් පවා තියෙනවා. එපමණක් නෙවෙයි උස්සගෙන යන වාහනයේ තියෙන ඩීසල් ටික පවා අරගෙන අඩු මිලට විකුණනවා. මිනිසුන්ගේ හිතේ ගින්දරත් එක්ක තමයි මේ අය කටයුතු කරන්නේ. මූල්‍ය ආයතන නීත්‍යානුකූලව ලියකියවිලි සකස් කරලා ටයිකෝට් දාලා මහත්වරු වගේ ගිවිසුම් අත්සන් කරනවා. නමුත් වාරික ගෙවා ගන්න බැරිවුණාම අමනුස්සයෝ වගේ ඒ මහත්වරුම උස්සනවා.**

**මෙම පසුබිම හොඳින් අධ්‍යනය කරලා ව්‍යාපාරික ප්‍රජා වගේම සාමාන්‍ය ජනතාව ආරක්ෂා කර ගැනීමේ කිසියම් ක්‍රමවේදයක් ඇති කළ**

යුතුයි. හතු පිපෙනවා වගේ මූල්‍ය ආයතන බිහි වෙනවා. සුළු ගාණක් දීලා වාහන ගෙනියන්න දෙනවා. මෙහි බරපතළ වගකීම නොදන්නා බෙහෝ දෙනා ෆිනෑන්සි වාරික ගෙවා ගන්න බැරිව අමාරුවේ වැටෙනවා.

අන්තිමට උස්සන වාහන සේල්වල අව්වට වැස්සට තෙමි තෙමී දිරාපත් වෙනවා. මේකද මේ රටේ මූල්‍ය කලමනාකරණය කියන්නේ ? මූල්‍ය ආයතන අප රටට අවශ්‍යයයි, නමුත් සේවා ලබා ගැනීමට එන සේවා දායකයන් දූනුවත් කරමින් විනිවිද භාවයකින් කටයුතු කරනවා වෙනුවට කොහොම හරි වෙළදාම කරන්න යාම නිසා ජනතාව අමාරුවේ වැටෙන අවස්ථා එමටයි.

කතාව හා සේයාරූ,
හිඟුරානේ,
නවරත්න සමරතුංග

## පසුවදන

**කලකිනි බුදු කෙනෙකුන් උපදින්නේ**
**දුකකිණි මිනිසත් බව ලැබගන්නේ**
**මෙදකිනි මෙසසර දුක් දුරලන්නේ**
**කුමදට? කුසලට කම්මැලි වන්නේ**

සතර අසංඛ්‍ය කල්පයටම ලොව පහළ වූයේ බුදුරජාණන් වහන්සේලා දොළොස් නමකි. කල්ප ලක්‍ෂයට පහළ වී වාදාලේ බුදුරජාණන් වහන්සේලා දහසය නමකි. එයිනුත් කල්ප සියයකට අපගේ ගෞතම බුදුරජාණන් වහන්සේ දක්වා බුදුරජාණන් වහන්සේලා දසනමක් ලෝ පහළ වූහ. එයිනුත් අප ජීවත්වන මෙම මහා භද්‍ර කල්පය තුළ පමණක් බුදුරජාණන් වහන්සේලා පස්නමක් පහළ වන්නේ ය. එයිනුත් මේ වනවිට හතර නමක් පහල වී පිරිනිවන්පා තිබේ. අප ජීවත්වන මෙම යුගයෙහි හතරවන බුදුරජාණන් වහන්සේගේ ශාසනය පවතී. මේ කල්පයෙහි අවසන් වරට බුදුබවට පත්වන මෛත්‍රී පිඬක්වූ මෛත්‍රී බුදුරජාණන් වහන්සේගේ පහළවීමත්, පිරිණිවීමත්, ශාසන අන්තර්ධාන වීමත් මෙම කල්පය විනාශවීමත් සමගින් නැවතත් බුදුරජාණන් වහන්සේ නමක් පහළ වන කාලයක් ගැන නම් සිතන්නවත් එපා.

එක කල්පයක ආයුෂ උපමාවෙන් මෙසේයි ඃ- සැතපුම් 16 ක් දිග දහසක් පළල 16 ක් ගැඹුරු පෙට්ටික් අතුරු සිඳුරු නොමැතිව අබ පුරවා අවුරුදු 100 ට එක අබ ඇටය බැගින් ඉවත් කළොත් එකී පෙට්ටිය හිස් වන්නේය. කල්පය ගෙවී අවසන් වන්නේ නැත.

එසේම (1) එක ඉලක්කමට බිංදුවක් එකතු කලොත් (10) ක් වන්නේය. තව බිංදුවක් එකතු කලොත් (100) ක් වන්නයේ. තව බිංදුවක් එකතු කලොත් (1000) ක් වන්නේය. තව බිංදුවක් එකතු කලොත් (10000) වන්නේය. තව බිංදුවක් එකතු කලොත් ලක්‍ෂයක් (100000) ක් වන්නා සේ, මෙයාකාරයට එකේ ඉලක්කමට බිංදු එකසිය හතලිහක් (140) එකතු කල කල්හි අසංඛ්‍ය කියන නම ලැබේ. එකතුවන බිංදු ගණන අනුව වන ප්‍රබල තාවය නොහොත් කාලයාගේ දීඝී භාවය ගැන සිතන්න පුළුවන්ද ? එක කල්පයේ පවත්නා කාලය අනුව අසංඛ කල්පය ගැන සිතන්න පුළුවන්ද?

එම අසංඛ්‍ය හතරටම පහළ වූයේ බුදුරජාණන් වහන්සේලා 12 නමක් නම් ''බුද්ධ'' කියන වචනයක්වත් අසන්නවත් නොමැති මහා කල්ප ගෙවී යන්න ඇත්ද ? මෙකී බුදුරජාණන් වහන්සේලා පහළවූ කාල වකවානු තුල අපි සිටියේ කොහේද ? අප සිටින්න ඇත්තේ සතර අපා, අටමහා නිරයන්හි, ලෝකන්තරික නිරයන්හි, නොඑසේනම් මිථ්‍යා දෘෂ්ඨි ආත්මවල හෝ අඳ, ගොළු, බිහිරි අංග විකල, මන්ද බුද්ධික නොහොත් පරමායුෂ අඩු කාලවලදී අපගේ ගෞතම සම්මා සම්බුදු රජාණන් වහන්සේ හැර අනෙක් තණ්හංකර බුදුරජාණන් වහන්සේගේ සිට කාශ්‍යප බුදුරජාණන් වහන්සේ දක්වා පරමායුෂ අවුරුදු විසිදාහෙන් (20000) ඉහළ ආයුෂ තිබුණ කාල වලින් ඉහල කාලවල පහළ වී තිබෙන නිසා ඇතැම් විට පරමායුෂ අවුරුදු (20000) න් පහළ කාලවල විය යුතුයි. අපි දන් සිටින ආත්මයට පෙර හෝ මින්පසු ලබන ආත්මයවත් නොදනිති.

**අඳුරෙහි අස්ලෙම විඳිනට** — **දුරදී**
**විදුලිය පැහැ වැරදුන හොත්** — **වරදී**
**විදුලියවත් මේ කයලත්** — **තැනදී**
**සිදු නොකොලොත් මතු සඟ මොක්** — **වරදී**

දූන් අපගේ අවධානය ඉහත සදහන් ණය බරින් සිරුරට ගිනි තබාගත් හොඳ පුරවැසියා කෙරෙහි යොමු කරමු. මෙම දහම් ග්‍රන්තය ඇතුළු තවත් බුදු දහම තුලින් අටමහ නිරයන්හි නිරන්තරයෙන් මිනිසත් භාවයේ ඉපදුන මිනිසුන් කරගත් වසල, නීච පහත් වැඩ හා අන්‍යයන්ට දුන්නාවූ චිත්ත පීඩාවන් සහ කායික පීඩාවන් හේතුවෙන් එකකට එකක් වෙනස් වූ නිරියන්හීදි යමපල්ලන් හා පණුවන්, උකුස්සන්, කවුඩන්, කිම්තුල්ලන් ආදී අති භයන්කාර සත්වයන් සහ ' ගූථ' නමැති අසූචි සහ මුත්‍රා වලින් පිරිණු දිග, පළල, ගැඹුරු යොදුන් ගණන් දුරට දුගඳ හමන නරකයන් මැවී තිබෙන්නේත්, ඒවායේ උපදින්නේත්, මිනිස් ලොව ආයුෂ වලින් එහි ආයුෂ පවසන්න බැරි තරම් අති දීර්ඝ කාලීනව ඇසිපිය හෙලන තරම්වත් බැරි තරම්වත් කාලයක් නිමක් නැති දුක් විඳවන්නේත් පාපකර්ම අකුසල බලයෙන් නොමැරෙන්නේත්, මැරුණත් ඒ සැණින් එහි උපදින්නේත් මුලක්, ආරම්භයක් නොපෙණන සසර ගමන නිසයි. බුදුරජාණන් වහන්සේ නමක් අතිශයින් දුක්විඳ දස පාරමිතාවන් සපුරා දස පාරමිතාවන් සම්පූර්ණ කරගැනීමට (නියත විවරණය) වෙහෙසෙන්නේ මේ දුක් විදින සත්වයාගේ සසර ගමන නවතා දැමීම උදෙසායි.

එම නිරයන්හි උපදින්න මිනිසත් භාවයේ උපදින මිනිසා කරන වැරදි මොනවාද ? එයින් බිඳක් පහත සඳහන් කරමි ඃ- සූරාව, සුදුව, ගණිකා ව්‍යාපාරය, අවි ආයුධ වෙළදාම, නිල බලය, ධන බලය දුබලයින්ට, දුබලයාට පීඩා පිණිස යොදා ගැනීම, සත්ගුණවත් ණය පහසුකම් දෙන ආයතන එම ණය නියමිත වේලාවට අයකර ගැනීමට නොහැකි වන අවස්ථා වල එකී ණය ගත් අයට කරන චිත්ත පීඩා, කායික පීඩා ආදිය සහ තම පියාගේ එක්වර වාහන දෙකක්ම මන්කොල්ල කෑම සහ රටපුරා එවනි (පිණෑන්ස්) සමාගම් මාර්ගයෙන් වාහන උස්සන එකී නිරයන්හි සිටින තිරිසතුන්ගේ මස් බොකු බඩවැල් ඇදගෙන කන පණුවන්, කවුඩන්, යමපල්ලන් මෙන් අත්අඩංගුවට ගත්

ති

වාහන ඇතුළු අනෙකුත් දේපොලවල මද හූරා කන මිනිසුන් සහ මස් කඩයට උත්සන වාහන සහ දේපොල හොරකම් කරන්නන් සහ ඔවුන්ගේ සහලේ ඥාතීන් (අඹු දරුවන්) ආදීන්ද ටයර් වෙළඳ සැලෙන් ණයට දුන් ටයර ආදිය වාහනයට එකතු කරන තෙක් හොර බැල්මෙන් සිට එම වාහනය ඉස්සූ පසු මුදල් ආයතනයට දීමට පෙර එකී ටයර් ආදී හොඳ කොටස් ඉවත් කරගෙන බාල බඩු ඒ වෙනුවට එකතු කරන්නවුන්ද එකී මනුෂ්‍යයන්ගේ ඉහ මොළ හූරාකන ආත්මාර්ථකාමී ආයතන හිමිකරුවන්ද එකී නිරයන්හි උපදවන්නේමය.

ශරීරයට ගිනි තබාගත් මහත්මයාට වූ දෙයටත් අන්ත අසාධාරණ දෙයක් මේ ලියන මටද රජයෙන් වී තිබේ. එයත් මෙහි සඳහන් කරමි.

රටේ පුරවැසියාගේ යහපත පිණිස සිටින රාජ්‍ය උකස් හා ආයෝජන බැංකුවෙන් 1980 කාලයේදී ( මම ගිහියකු වශයෙන් සිටි කාලය) නිවසක් ඉදිකිරිම සඳහා ණය මුදලක් ලබා ගැනීම සඳහා එම බැංකුවට අයදුම් පතක් ඉදිරිපත් කර එහි නීති, කොන්දේසි අනුව ක්‍රියාකර (අල්ලසක් නොදුන් නිසා) අවුරුදු එකහමාරකට වැඩි කාලයක් මම අපමණ වෙහෙසටත්, නිකරුණේ එහි කොන්දේසි ඉල්ලීම සපුරාලීම සඳහා රු. 5000/- කට වැඩි මුදලක් වියදම් කරවා අවසානයට රු. 50000/- මුදලක් අනුමත වූයේ වාර තුනකින් ලබාගැනීමටය. එකී පනස් දහසේ මුදලට අත්සන් කලත් අන්තිමට 45000/- ටත් අඩුවන තෙක් නොයෙකුත් මාතෘකා උඩ අය කරගෙන කොළඹ හොල්ටන් පෙදෙස පිහිටි තනි මහල මහල් 10 ට අධික ගොඩනැගිල්ලක් කොල්ලුපිටියේ හන්දිය අසල පිහිටවා ගන්නා තුරු මුදල ලැබුනේ නැත. ලැබුණු මුදලෙන් මට එම නිවස ඉදිකිරීමට ගත් ණයට වඩා රාජ්‍ය උකස් හා ආයෝජන බැංකුවට වාරික මුදල් වශයෙන් ගෙවීමට සිදුවිය.


සාමාන්‍ය මිනිසුන්ට  රාජ්‍ය උකස් හා ආයෝජන බැංකුවෙන් කරපු අසාධාරණකම් ගැන එවකට පාර්ලිමේන්තුවේ  සිටි ජෙයරාජ් ප්‍රනාන්දු පුල්ලේ මැතිතුමා පවා මෙකී බැංකුව කරපු පහත් වැඩ පෙන්වා දුන්නේය.

පර සුද්දාගෙන් නිදහස ලබාගත් පසු '' සුද්දා රට ගියා, පද්දා උඩ ගියා'' කියපු ආකාරයටත් අනගාරික ධර්මපාලතුමාගේ එම කියමන අදට එදාටත් වඩා සද්දූසක් සේ සත්‍යය වී තිබේ. රටේ නීතිය සහ සාමය අකුරටම ඉටුකරන අධිකරණය සහ පොලිසිය සාමන්‍යය පුරවැසියාට කරන අසාධාරණ කම් (රාජකාරියට හාදා කිරීම්) ආදී අභූත චෝදනා වලට නීතිය අකුරටම ඉටුවේ. එමනිසා මෙකී පහත් වැඩ කරන නිල බලය අයුතු අන්දමට ක්‍රියා කරන මහජන මුදලෙන් යැපෙන, වරප්‍රසාද ලබා ගන්නා අඹු දරුවන් පවා උපදින්නේ අටමහ නරකාදිවල බව සිතන්න.

ශරීරයට ගිනි තබා ගත් මහත්මයාත් පෙර භවයක කරගත්තාවූ අකුසලයක ශේෂ විපාක වශයෙන් එවැනි ක්‍රියාවක් කර ගැනීමට සිදුවූයේ පෙර භවයක බුදු සසුනක්  තුල  මොනයම් ආකාරයකින්  හෝ කරගත් කුසල කර්මයක් හේතුවෙන් සම්බුධ ශාසනයක් පවතින කාලයක එම බුදු සසුනේ භාණ්ඩාගාරය වන රටේ (ශ්‍රී ලංකාව) මිනිසත් භාවයත්, පිරිමි ආත්මයක්, අඳ, ගොළු, බිහිරි, අංග විකල, මන්ධ බුද්ධික, මිත්‍යා දෘෂ්ඨියෙන් තොර, වටිනා පුරවැසියෙකු වී ඉපදීමත් එවන් අවාසනාවන්ත ඉරණමකට මුහුණ පැවත් මෙම බුදු සසුන තුළ කරගෙන තිබෙන සත් ක්‍රියාවන් නිසා මේ කල්පයේ අවසානයට පහළවන බුදු රජාණන් වහන්සේගේ ශාසනය තුළදී සියළුම සංසාර දුක්ඛයන්ගෙන් මිදී ජාතියක්, ජරාවක්, ව්‍යාදියක්, මරණයක් නැවත මවුකුස පිළිසිඳ ගැනීමක් නැති අජරාමර නිර්වාණ සම්පත්තිය ලබන්නේය.

''රටට ආදරය ගෞරවය ඇති සාමාන්‍ය ජනතාවගේ දුකට පිහිටවන පුරවැසියන් පාලකයන් වේවා'' යි පතමි.


මීට, මෙතැති,
පූජ්‍ය අකුරේගොඩ රතනසාර හිමි,
ගුණරත්න යෝගාශ්‍රමය,
තල්වත්ත, කැළණිය.
23.01.2016
(පොහෝ දින)



සිරුරට ගිනි තබගත්
ව්‍යාපාරික මහතා




සිරුරට ගිනි තබාගත් ව්‍යාපාරිකයා
ප්‍රධාන මාර්ගයට පැමිණි අවස්ථාව




පොළොන්නරුවේ රන්කොත් වෙහෙර